**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව පිළිවෙලින් පිරිවැය රු.53,474,393ක් හා රු.375,028,008ක් වූ මෝටර් රථවාහන සහ විද්‍යාගාර උපකරණ ප්‍රත්‍යාගණනය කිරිමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. තවද, ප්‍රමිතියේ 90 ඡේදය හා 92 ඡේදයේ (ආ) ප්‍රකාරව දේපළ පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇතිවිට ප්‍රත්‍යාගණිත වත්කම් සම්බන්ධයෙන් දැක්විය යුතු හෙළිදරව් කිරීම්ද, සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද එහෙත් තවදුරටත් භාවිතා කරමින් පවතින පිරිවැය රු.160,385,708 ක් වූ දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ප්‍රත්‍යාගණනය පිළිබඳ අදාල හෙළිදරව් කිරීම විගණන වාර්ථාවේ දැක්වීම අතපසු වී ඇත. සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද ඉතිරි වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දින වන විට වැඩ නිමකර භාවිතයට ගෙන තිබූ රු.735,171,684ක පිරිවැය වූ ගොඩනැගිල්ල තවදුරටත් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබීමෙන් එම වටිනාකමින් ගොඩනැගිලි ශේෂය අඩුවෙන් හා කෙරීගෙන යන වැඩ ගිණුමේ ශේෂය වැඩියෙන් දැක්වුණි. | නව ගොඩනැගිල්ලේ බහුතරයක් කටයුතු අවසන් වුවත් බොහොමයක් කොන්ත්‍රාත්කරුවන්ගේ අවසන් බිල් ගෙවා නැත.එමනිසා, නව ගොඩනැගිල්ල ප්‍රාග්ධනිත කිරීමේ හැකියාවක් නොතිබුණි. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන්ව ඇත්නම් එය ප්‍රාග්ධනිත කල යුතුය. |
| (ආ) | සේවා සැපයීම වෙනුවෙන් ලද රු.1,701,593 ක ආදායම් මූල්‍ය ප්‍රකාශන තුල ආදායම් ලෙස හඳුනාගැනීම වෙනුවට ජංගම වගකීම් ලෙස ගිණුම්ගත කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල වගකීම් හා වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | මෙම ප්‍රේෂණ දිස්ත්‍රික් කාර්යාල වලින් කල ප්‍රේෂණ නොව ප්‍රධාන කාර්යාලයට අදාල ප්‍රේෂණ වේ.මෙම රුපියල් 1,701,593 ක ශේෂයෙන් රුපියල් 1,193,960 ක් මේ වන විට හඳුනා ගෙන ඇති අතර ඒ බව ගිණුම් ප්‍රකාශණ වලද දක්වා ඇති බව. | හඳුනා නොගත් වත්කම් ලැබීම් නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සංවිධානය විසින් බාහිර පාර්ශව වෙනුවෙන් ඉදිකිරීම් නිමකරන ලද ව්‍යාපෘති වලට අදාලව ලැබිය යුතු රු.7,038,077ක ආදායම් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කිරීම නිසා ජංගම නොවන වත්කම් හා ලැබිය යුතු ආදායම් එම වටිනාකමින් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | මේ සම්බන්ධව අයවියයුතු මුදල් පිලිබඳ විස්තර අදාල ආයතන වලට යවා ඇති අතර එම ආයතනවල එකඟතාව ලැබුන පසු අප ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය හරහා ඉන්වොයිස් නිකුත් කිරීමට කටයුතු කරන බව. | ඉදිකිරීම් නිමකරන ලද ව්‍යාපෘති වලට අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 ජේදය සහ ඇමුණුම 02 ආකෘතිය | මානව සම්පත් සැලැස්මක් සංවිධානය විසින් පිළියෙල කර නොතිබුණි. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මඟින් රාජ්‍ය සේවය සඳහා දිගුකාලීන මානව සම්පත් සැලැස්මක් සම්පාදනය කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් සහ අනුකමිටු පත් කිරීම සඳහා සුදුසු නිලධාරියකු පත්කර එවන මෙන් දන්වා ඇති අතර ඒ අනුව නිලධාරියකු නම්කර යවන ලදී. ඒ පිළිබඳ ඉදිරි පියවර පළාත් පාලන අමාත්‍යාංශයෙන් විමසා ඉදිරි කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛයේ විධිවිධාන පරිදි මානව සම්පත් සැලැස්ම සකස් කල යුතුය. |

## 1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් විමසා අනුමැතිය ලබා නොගෙන මුදල් පදනම මත බදු ගෙවීම සිදුකර තිබුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ආරම්භයේ සිටම එකතු කල අගය මත බදු ගෙවා ඇත්තේ මුදල් පදනම මතය. මේ සම්බන්ධව අනුමැතියක් ලබා ගෙන ඇතිදැයි සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන බව. | දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් විමසා අදාල අනුමැතිය ලබා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 235,379,561 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 266,985,727 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 31,606,166 ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට ව්‍යාපෘති කළමනාකරණ අංශයේ අතිරික්තය රු.5,453,191කින්ද, භූ තාක්ෂණික සහ ඉංජිනේරු අංශයේ අතිරික්තය රු.4,220,114කින් ද, නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශයේ අතිරික්තය රු.3,563,199කින් ද අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පරිසර අධ්‍යයන හා සේවා, මානව ජනාවාස සැලැසුම් සහ පර්යේෂණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය යන අංශවල අතිරික්තය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී පිළිවෙලින් සියයට 146,130 හා 170 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පර්යේෂණ භූ තාක්ෂණික හා ඉංජිනේරු, නාය යෑම් පර්යේෂණ සහ අවදානම් කළමණාකරණ, ව්‍යාපෘති කළමනාකරණ යන අංශවල අතිරික්තය 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී පිළිවෙලින් සියයට 29 ,36 හා 28 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීමට ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2021 ඔක්තෝම්බර් 12 දින අනුමැතිය ලැබී ඒ අනුව පිළියෙල කල පනත් කෙටුම්පත 2022 සැප්තැම්බර් 26 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවා තිබුණද, මෙතෙක් එම පනත පිළියෙල කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමත කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය පිහිටුවා වසර 31 | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් සැකසූ පනත් කෙටුම්පත සඳහා නීතිපති දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී ඇත. එම පනත් කෙටුම්පත සහ අමාත්‍ය මණ්ඩල සංදේශය 2024 පෙබරවාරි 21 වන දින ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම පිණිස ආරක්ෂක ලේකම් තුමා වෙත ඉදිරිපත් කර ඇත. ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව කැබිනට් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට | කඩිනමින් පනත සම්මත කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් පමණ ගතවී ඇතත්, නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් සම්මත කර ගැනීමට නොහැකි වී තිබුණි. | නියමිත බව. | |
| (ආ) | 2013 වර්ෂයේ සිට සංවිධානයේ නිලධාරීන් සඳහා ක්‍රියාත්මක වෙමින් පැවති සමූහ ජීවිත රක්ෂණ හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් වෙනුවෙන් රු.9,815,793ක මුදලක් රක්ෂණ ආයතනය වෙත ගෙවා තිබුණද රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, සංවිධානයේ සේවකයන් 23 දෙනෙකු විසින් අවස්ථා 29කදී ව්‍යාජ බිල්පත් හා ව්‍යාජ ලෙස නිල මුද්‍රා සකස්කර සමූහ ජීවිත රක්ෂණ හා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ<br><br>රු.1,820,000ක වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. මෙලෙස ව්‍යාජ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් හයදෙනෙකුගෙන් රු.440,000 ක මුදලක් සංවිධානය විසින් අයකර ගෙන තිබුණද එම නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම වංචනික ක්‍රියාව සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය වූ වහාම විමර්ෂණයක් සිදුකර සියලු දෙනාගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. සේවකයින් පිරිසක් වංචනික ලෙස ලබාගත් මුදල් ගෙවීමට එකඟ වී මේ වන විට ආපසු ගෙවමින් පවතී. මෙම සිද්ධිය සම්බන්ධයෙන් මේ වන විට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් ආරම්භ කොට ඇත. ඒ අනුව ලැබෙන උපදෙස් මත කටයුතු කරන බව. | රක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය.තවද, කූඨ ලේඛන සකස්කර රක්ෂණ වන්දි ලබාගත් නිලධාරීන් සම්බන්ධව ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ - AR 2 තනතුරට බඳවාගැනීම සඳහා සකස් කරන ලද මූලික බඳවාගැනීම් පටිපාටියට පරිබාහිරව අනුමත නොවූ පටිපාටියක් සකස්කර සම්මුඛ පරීක්ෂණ 02 ක් පවත්වා බඳවාගැනීමේ පටිපාටියේ ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් එම තනතුර සඳහා බඳවාගැනීම හේතුවෙන් මූලික සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගත් නිලධාරීන් තිදෙනෙකුට උක්ත තනතුරට උසස්වීම් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | මේ සම්බන්ධව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් වාර්තාවක් ලබා දී ඇති අතර ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කරමින් පවතින බව. | බඳවාගැනීම් පටිපාටිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති සේවාවන් සඳහා දීමනා ගෙවීමේදී කළමනාකරණ කමිටු අනුමැතිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියද සහිතව අදාල දීමනා ගෙවිය යුතු බවට 2021 දෙසැම්බර් 28 දිනැති විගණන හා | සේවාවන් සිදුකරනු ලබන ඉංජිනේරු සහ භූ විද්‍යාඥයින්ගේ විශේෂිත කාර්යයන් සඳහා එම තනතුරු වලට දීමනාවක් කොන්ත්‍රාත්තුව පිරිනමන ආයතනය විසින් ගෙවනු ලබයි. මෙම උපදේශන සේවාවේදී විශේෂඥ සේවා සැපයීම සඳහා | අදාල අනුමැතිය ලබාගෙන ගෙවීම් කළ යුතුය. |

| | |
|---|---|
| කළමනාකරණ කමිටුව නිර්දේශ කර තිබුණද,එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.1,927,035ක මුදලක් ව්‍යාපෘති සේවාවන් සඳහා දීමනා ලෙස ගෙවා තිබුණි. | වැටුපෙන් 1/3 ක් ගෙවීම පාදක කරගෙන දීමනා ගෙවීමට කළමනාකරණ කමිටුව විසින්ද ලබාදෙන ලද අනුමැතියට යටත්ව අදාල නිලධාරීන් වෙත මෙම දීමනා 2023 වර්ෂයේ ගෙවා ඇති බව. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවධානම් සහිත දිස්ත්‍රික්ක 14ක නායයෑම් පූර්ව අනතුරු හැඟවීම් නිකුත් කිරීම සඳහා දත්ත ලබාගැනීමට ස්වයංක්‍රීය වර්ෂාමාන 330 ක් ස්ථාපිත කර තිබූ අතර එයින් වර්ෂාමාන 251 ක් පමණක් නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයට සම්බන්ධ කර තිබුණි. ඉන් වර්ෂාමාන 198 කින් පමණක් දැනට තොරතුරු ලැබෙන බැවින් ඉතිරි වර්ෂාමාන අක්‍රීය තත්වයක හෝ තොරතුරු නොලැබෙන මට්ටමක පැවතුණි. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් හඳුනාගත් නායයෑම් අවදානම් දිස්ත්‍රික්ක 14 ක අධික නායයෑම් අවදානමක් ඇති ස්ථානවල ස්වයංක්‍රීය වර්ෂාමාන 332 ක් මේ වන විට ස්ථාපිත කර ඇත.මෙම වර්ෂාමාන සියල්ල අවුරුදු 05 කට වඩා පැරණි වන අතර 2024 අප්‍රේල් 22 දින වනවිට වර්ෂාමාන 100 කට ආසන්න ප්‍රමාණයක් අක්‍රීයව පැවතුණි. නායයෑම් අනතුරු ඇඟවීමේ නිවේදන පවතින තත්ත්වය අනුව විවිධ ක්‍රම භාවිතා කොට නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලබන බව. | ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය නිසියාකාරව නඩත්තු කල යුතුය. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නායයෑම් අවදානම් සහිත දිස්ත්‍රික්ක 11 කින් නායයෑම් පරීක්ෂණ වාර්තා ලබාගැනීම සඳහා ඉල්ලුම්පත් 5,388ක් ලැබී තිබුණු අතර තවදුරටත් නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 1,545ක් විය. එසේම පසුගිය වර්ෂයේ ලද ඉල්ලුම්පත්ද ඇතුළුව 2023 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිර්දේශ ලබාදිය යුතු ඉල්ලුම්පත් සංඛ්‍යාව 2,889 ක් වූ අතර එය වර්ෂය තුළ නිර්දේශ ලබාදීමට පැවති ඉල්ලුම්පත් ප්‍රමාණයෙන් සියයට 43 ක ප්‍රතිශතයක් විය. සංවිධානයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ, විද්‍යාඥ, කළමනාකරු සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) යන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක පුරප්පාඩු 53 ක් පැවතීම මෙම | 2023 වසරේ සැප්තැම්බර් 26 දින සිට වර්ෂය අවසානය දක්වාම දිවයිනේ කඳුකර ප්‍රදේශවලට බලපෑ අධික වර්ෂාපතනය හේතුවෙන් විශාල වශයෙන් නායයෑම් අවදානම් ස්ථාන වාර්තා විය. සංවිධානයේ සේවයේ නියුතු සීමිත නිලධාරීන් යොදා ගනිමින් එම දිනවල පැවැති අධික ඉල්ලීම මත අධි හා මධ්‍යස්ථ අවදානම් ස්ථාන සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදුකර ක්ෂණිකව ගත යුතු ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඇතුළත් හදිසි ප්‍රතිචාර වාර්තා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිකුත් කර ඇත. නායයෑම් අවදානම් රහිත ස්ථාන සඳහා ලද ඉල්ලීම් අවලංගු කල පසු, නිර්දේශ ලබා නොදුන් ඉල්ලීම් සඳහා ඉදිරියේදී වාර්තා ලබා දීමට කටයුතු යොදා ඇති බව. | පරීක්ෂාව සඳහා ලබාදුන් ඉල්ලුම්පත් කඩිනමින් පරීක්ෂාකර වාර්තා ලබාදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තත්ත්වය කෙරෙහි සැලකියයුතු බලපෑමක් සිදුකර තිබුණි. | | |
| (ඇ) | වර්ෂාමාන උපකරණ සකස්කිරීම, අලෙවිකිරීම හෝ නොමිලේ බෙදාහැරීම සංවිධානයේ කාර්යයක් නොවුවද රු.1,502,539ක් වූ අමුද්‍රව්‍ය මිලදීගෙන සාම්ප්‍රදායික වර්ෂාමාන 480ක් සකස්කර තිබුණි. බදුල්ල, කෑගල්ල හා නුවරඑළිය යන දිස්ත්‍රික්ක 03ක් ආවරණය වන පරිදි සංවිධානය විසින් සවිකර තිබුණු සාම්ප්‍රදායික වර්ෂාමාන 145 ක් වර්ෂ 02ක පමණ කාලයක සිට දත්ත ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. විගණිත දිනය වූ 2023 නොවැම්බර් 13 න් පසුව මින් වර්ෂාමාන 370ක් නොමිලේ බෙදා දී තිබූ අතර වර්ෂාමාන 110ක් රු.605,000 කට අලෙවි කර තිබුණි. | මධ්‍යගත ස්ථානයක සිට පූර්ව අනතුරු නිකුත් කිරීම සඳහා සාම්ප්‍රදායික වර්ෂාමාන දත්ත භාවිතා කළ නොහැක. ඒ සඳහා ස්වයංක්‍රීය වර්ෂාමානවල දත්ත භාවිතා කරනු ලැබේ. පර්යේෂණ ආයතනයක් ලෙස, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් මෙම කාරණය සඳහා අවශ්‍ය සාම්ප්‍රදායික වර්ෂාමාන නිපදවීම සිදුකරන ලදී. දැනට හඳුනාගෙන ඇති නායයෑම් අවදානම් ප්‍රදේශවල ජීවත්වන ප්‍රජාවන් මූලික කර ගෙන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේද සහාය ඇතිව ප්‍රජා මූලික වැඩසටහන් මඟින් එම ජනතාවගේ නායයෑම් අවදානම් තත්ත්වය කළමනාකරණය කිරීම සංවිධානයේ අරමුණ වන බව. | සංවිධානයේ අරමුණු වලින් බැහැරව කටයුතු නොකල යුතුය. |
| (ඈ) | 2019 වර්ෂයේ ආරම්භ කර 2023 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබූ ගොඩනැගිලි තක්සේරුකරණය හා තත්ත්ව වාර්තාකරණය සඳහා ක්‍රමෝපාය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ කාර්ය ඉටු කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 125 ක ප්‍රතිපාදන ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එයින් රුපියල් මිලියන 105 ක් වැය කර තිබුණද ගොඩනැගිලි තක්සේරුකරණය හා තත්ත්ව වාර්තා නිකුත් කිරීම් සම්බන්ධව ලද ඉල්ලුම්පත් ප්‍රමාණය, පරීක්ෂා කරන ලද ඉල්ලුම්පත් ප්‍රමාණය, නිකුත් කළ වාර්තා ප්‍රමාණය යනාදී තොරතුරු ක්‍රමවත්ව පවත්වාගෙනයාමට නිසි පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා සංවිධානයේ අවධානය යොමු වී නොතිබුණි. | ගොඩනැගිලි තක්සේරුකරණය හා තත්ත්ව වාර්තා නිකුත් කිරීම සම්බන්ධව ලද ඉල්ලීම් ප්‍රමාණය, පරීක්ෂා කරන ලද ඉල්ලුම්පත් ප්‍රමාණය, නිකුත් කල වාර්තා ප්‍රමාණය ආදී තොරතුරු සංවිධානය ක්‍රමවත්ව පවත්වාගෙන යයි.කෙසේ වුවද, මෙම තොරතුරු එක්රැස් කිරීම හා පවත්වා ගැනීම තවදුරටත් වේගවත්ව හා ක්‍රමවත්ව කිරීමේ අරමුණෙන් නව මෘදුකාංගයක් හරහා සිදු කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට සිදුකරමින් පවතින බව. | තක්සේරුකරණය හා තත්ත්ව වාර්තා නිකුත් කිරීමට අදාල තොරතුරු ක්‍රමවත්ව පවත්වාගෙනයාමට නිසි තොරතුරු පද්ධතියක් ස්ථාපිත කල යුතුය. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ කාර්යයන් සඳහා මහා භාණ්ඩාගාරය සහ වෙනත් ආයතන වලින් ලද රු.309,847,914 ක මුදල් අදාළ කාර්යයන් සඳහා නොයොදවා 2023 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර ඉන් රු.160,525,112 ක ස්ථාවර තැන්පතු වසර 1 සිට වසර 7 දක්වා කාලයක් තිස්සේ පැවතුණි. | 2023 වර්ෂයට අදාල ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබීමේ අවිනිශ්චිතතාවය සහ ප්‍රමාදය මත ව්‍යාපෘති ආරම්භ කිරීම ප්‍රමාද වූ අතර 2024 වර්ෂයේ සියලු ව්‍යාපෘති නිම කිරීමට සැළසුම් කර ඇති බව. | ප්‍රතිපාදන ලබාදුන් කාර්යයන් සැලසුම් කළ අයුරින් ඉටුකිරීමට පියවර ගත යුතුය. |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානය වෙත වායු විමෝචන අරමුදලින් පරිත්‍යාග ලෙස ලැබුණු රු.41,376,000 ක් වටිනා ජංගම වායු තත්ත්ව අධීක්ෂණ ඒකකය සවි කරන ලද ලොරි රථය වසර 4 ක කාලයක සිට ජංගම අධීක්ෂණ සේවය නොසපයා කොළඹ මහ නගර සභා පරිශ්‍රයට පමණක් සේවය සපයා තිබුණි. | වෙනත් නාගරික ප්‍රදේශ වලට ගෙන ගොස් වායුගුණ මැනීම සඳහා අධික වියදමක් දැරීමට සිදු වීම හා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම නිසා අදාළ ඒකකය කොළඹ මහා නගර සභා පරිශ්‍රයේම ස්ථානගත කර ඇත.2024 වර්ෂයේ මෙම ඒකකය යොදා ගෙන දිස්ත්‍රික්ක 25 හි ම ප්‍රධාන නගර වල වායු ගුණ මැනීමට කටයුතු යොදා ඇති බව. | කොළඹ මහ නගර සභා පරිශ්‍රය හා අනෙකුත් නාගරික ප්‍රදේශවලට සේවා සැපයීමට කටයුතු කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවිධානයේ නව ගොඩනැගිල්ලේ Aluminum & Steel Work (Partition Work), Design, Supply and Installation of Glass Cutting wall, Glass Facade Including Tempered Doors සහ Mechanical, Electrical & Plumbing Works යන කාර්යයන් සඳහා රු.179,941,637ක් වූ වටිනාකමකට කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු වෙත 2017 හා 2019 වර්ෂ තුලදී ලබා දී තිබුණි. අවස්ථා 08 කදී එම කොන්ත්‍රාත්තු දින දිර්ඝ කර තිබුනත් එම කාලය තුලදීත් එකී කොන්ත්‍රාත්තු නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වී තිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ පාලනයෙන් පරිබාහිරව සිදුවූ කරුණු සැළකිල්ලට ගෙන කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඒ අනුව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු නොකරන ලද බව. | සැලසුම් කල පරිදි ඉදිකිරීම් කටයුතු නිමකර ගැනීමට හා ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට විධිවිධාන සලසාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මෙම කොන්ත්‍රාත්තු වෙනුවෙන් කල වැඩ වටිනාකම වූ රු.164,077,150 ක් සඳහා ගෙවීම් කර තිබුණද වැඩ ප්‍රමාද වූ කාලයට ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසියක් නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | | |
| (ආ) | ඉහත ගොඩනැගිල්ල සඳහා ගිනි ආරක්ෂණ සහ හඳුනාගැනීමේ පද්ධතියක් සපයා සවිකොට ස්ථාපනය කිරීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැටි රහිතව රු.8,281,955ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. 2023 ජූලි 24 දින සිට ආරම්භ කර දින 30ක් ඇතුළත නිම කල යුතුව තිබූ මෙම කාර්යයට 2023 නොවැම්බර් 24 විගණන දිනය වන විට දින 120 ක් ගතව තිබුණත් නිම කිරීමට නොහැකි වී තිබුණි. කල වැඩ වටිනාකම වූ රු.6,811,951 ක් සඳහා ගෙවීම් සිදුකර තිබුණද වැඩ ප්‍රමාද වූ කාලයට ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසියක් නොතිබීම හේතුවෙන් ප්‍රමාද ගාස්තු අය කිරීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | දින 30 ක් තුල කාර්ය නිම කිරීමට නියමිතව තිබුනත් අනෙකුත් කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ නිමකිරීමේ සමහර කොටස් ප්‍රමාද වීම නිසා එය මෙම කොන්ත්‍රාත්කරුගේ වැඩ නිමකිරීමට බාධාවක් විය. ඉහත කරුණට අමතරව ඉදිකිරීම් සිදු කරන අවස්ථාවේදී මූලික සැලසුම්වලට අමතරව ප්‍රායෝගික අවශ්‍යතාවන් මත අමතර වැඩකොටස් මෙම කොන්ත්‍රාත්තුව තුලද සිදු කිරීමට සිදුවීම නිසා අමතර කාලයක් ලබාදීමට සිදුවූ බව. | සැලසුම් කල පරිදි ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු නිම කරගැනීමට පියවර ගත යුතුය. |